# ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍ය අවශ්‍යතා ඉටුකරන බැංකුවක් ලෙස සමෘද්ධි බැංකුව, ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර දියුණුව සඳහා ඉටුකළ දායකත්වය පිළිබඳ අධ්‍යයනය

2017

RDTRI





## ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

සමාජ සවිබල ගැන්වීම්, සුභ සාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය

**උපදේශකත්වය හා මගපෙන්වීම**

චතුර උමගිලිය - අධ්‍යක්ෂ

අයි. එස්. රත්නායක - සහකාර අධ්‍යක්ෂ

ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

**දත්ත රැස්කිරීම, විශ්ලේෂණය සහ වාර්තාව සකස් කිරීම**

ප්‍රදීප් ලංකාපෙල - පුහුණු හා පර්යේෂණ සහකාර

**පරිගණකගත කිරීම**

සඳකලා ක්‍රියේෂන් - පිළිමතලාව

**ප්‍රකාශනය**

ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

නො. 24/4,

කාසල් වීදිය

කොළඹ - 08

2017.11.30

# ස්තුතිය

අධ්‍යයනයේ වැදගත්කම හා අවශ්‍යතාවය පෙන්වා දෙමින් මෙවන් අධ්‍යයනයක් සඳහා යොමුකර නිරන්තරයෙන්ම මා දිරිමත් කල ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ චතුර උමගිලිය මහතාටත්,

මාතෘකාව තෝරා ගැනීමේ සිට වාර්තාව මුද්‍රණය දක්වා වූ සෑම අවස්ථාවකදී අවශ්‍ය වූ උපදේශකත්වය හා මග පෙන්වමින් නිබඳ ශක්තියක් වූ ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ පිළිමතලාව මධ්‍යස්ථානයේ සහකාර අධ්‍යක්ෂ අයි. එස්. රත්නායක මහත්මියටත්,

අධ්‍යයනය පිළිබඳ සොයා බලමින් මා හට අත්වැලක් වූ ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ පර්යේෂණ අංශයේ සහකාර අධ්‍යක්ෂ එම්. එස්. එස්. නස්ලි මහත්මියටත්,

අධ්‍යයනයේදී අවශ්‍ය දත්ත හා තොරතුරු ලබා දීම සඳහා සහයෝගය දැක්වූ උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්,

අධ්‍යයනය සඳහා නියැදිය තෝරා ගැනීම සඳහා නොමද සහයෝගයක් දැක්වූ උඩුනුවර සමෘද්ධි මහා සංගමේ කළමනාකාර අධ්‍යක්ෂ ඇතුළු කාර්ය මණ්ඩලයටත්,

ක්ෂේත්‍රය තුලදී සමෘද්ධි බැංකුවහරහා ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ලබාදී ගොඩනැගුණු ව්‍යවසායකයින් සම්බන්ධ කරදී මාර්ගය පෙන්වමින් නොමද සහයක් දැක්වූ උඩුනුවර සමෘද්ධි කලාපවල කළමනාකරුවන් සහ සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ටත්,

නියැදිය සඳහා තෝරාගත් ව්‍යවසායකයින් සියලු දෙනාටත් ඒ අතරින් මෙම අධ්‍යයනය සඳහා හඳුනාගත් සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහනින් ගොඩනැගුණු සාර්ථක ව්‍යවසායකයෙකු වන කේ. පී. රම්මැණිකේ මහත්මිය ඇතුළු පවුලේ සැමටත්,

මෙම අධ්‍යයනය සාර්ථක කර ගැනීම සඳහා සෑම අයුරින්ම සහයෝගය ලබා දුන් පිළිමතලාව මධ්‍යස්ථානයේ සියළුම නිලධාරීන්ටත්,

නිසි කලට වේලාවට වාර්තාව පරිගණකගත කරමින් සහයෝගය දැක්වූ සඳකලා ක්‍රියේෂන් - පිළිමතලාව ආයතනයටත්,

***කෘතවේදී පුණ්‍යමය පුද කරමි.***

ප්‍රදීප් ලංකාපෙල

පුහුණු හා පර්යේෂණ සහකාර

ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

# පටුන


පළවෙනි පරිච්ඡේදය

| | | |
|---|---|---|
| 1.1 | හැඳින්වීම | 01 |
| 1.2 | කාලීන අවශ්‍යතාවය | 05 |
| 1.3 | අරමුණු | 06 |
| 1.4 | අධ්‍යයන ක්‍රමවේදය | 06 |
| 1.4.1 | දත්ත රැස්කිරීම | 06 |
| 1.4.1.1 | නියදිය තෝරාගැනීම | 06 |
| 1.4.1.2 | ප්‍රාථමික දත්ත රැස්කිරීම | 07 |
| 1.4.1.3 | ද්විතික දත්ත රැස්කිරීම | 07 |
| 1.4.2 | දත්ත විශ්ලේෂණය | 07 |
| 1.4.3 | අධ්‍යනයේ සීමා | 08 |

දෙවෙනි පරිච්ඡේදය

| | | |
|---|---|---|
| 2.1 | හැඳින්වීම | 09 |
| 2.1.1. | උඩුනුවර කොට්ඨාශයේ සමෘද්ධි වැඩසටහන මගින් ක්‍රියාත්මක ජීවනෝපාය සංවර්ධන වැඩසටහන්, | 09 |
| 2.1.2. | උඩුනුවර කොට්ඨාශය තුල ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන | 10 |
| 2.1.3. | උඩුනුවර කොට්ඨාසයේ සමෘද්ධිය වැඩසටහන තුලින් ව්‍යවසායකයාට ලැබී ඇති ප්‍රයෝජන | 11 |
| 2.2 | අධ්‍යයන ප්‍රදේශයේ පසුබිම | 12 |
| 2.2.1. | භූගෝලීය පිහිටීම | 12 |
| 2.2.2. | උඩුනුවර කොට්ඨාශයේ මූලික දත්ත හා තොරතුරු | 13 |
| 2.2.3. | අධ්‍යයන නියැදියේ පසුබිම | 15 |
| 2.3 | සාර්ථක ව්‍යවසායකයා පිළිබඳ තොරතුරු | 21 |
| 2.4. | ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයින් මුහුණ දෙන ගැටලු හා බාධක | 30 |

තුන්වන පරිච්ඡේදය

| | | |
|---|---|---|
| 3. | නිගමන හා යෝජනා | 32 |
| 3.1 | නිගමන | 32 |
| 3.2 | යෝජනා | 33 |

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 34

අන්තර්ජාල පිවිසුම 34

# පළවෙනි පරිච්ඡේදය

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ යැපුම් ආර්ථිකය වෙළඳ ආර්ථිකයක් බවට පරිවර්තනය වීමේදී ප්‍රබල භූමිකාව වූයේ ව්‍යවසායකයායි. ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටක් වුවද කර්මාන්ත හා සේවා අංශ වලද ආර්ථිකයට කැපී පෙනෙන දායකත්වයක් ලබා දී ඇත. යැපුම් කෘෂිකර්මාන්තය ව්‍යාපාරික කෘෂි කර්මාන්තය බවට පරිවර්තනය වීමේදී ගොවියා ව්‍යවසායකයකු විය. සෑම ගොවි මහතෙකුම තම පරිභෝජන අවශ්‍යතාවයෙන් ඔබ්බට ගොස් ලාභ පරමාර්ථයෙන් තම නිෂ්පාදන වෙළඳපලට සැපැයීමට දායක විය. තම පරිභෝජනය සඳහා ඇතිකල සත්ත්ව නිෂ්පාදන ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාම ග්‍රාමීයව දක්නට ලැබෙන සුලභ කරුණකි. එම හේතු නිසා ග්‍රාමීයව සුළු පරිමාණ ව්‍යවසායකයින් බිහි වී ඇති බව දක්නට ඇති ලක්ෂණයකි. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයින්ගෙන් ජාතික ආර්ථිකයට ලැබෙන දායකත්වය ඉහල අගයක් පෙන්නුම් කරයි. ශ්‍රී ලංකාවේ වැඩවසම් ආර්ථිකය බිඳ වැටී වෙළඳ ආර්ථිකයක් බවට පරිවර්තනය වීමද ග්‍රාමීය ව්‍යවසායකයන් බිහි වීමට හේතු වූ බව පර්යේෂණ වලින් පෙන්වා දී ඇත (පෙරේරා 1990 - ව්‍යවසායකයා).

1978 පසුව රටේ අනුගමනය කල විවෘත ආර්ථික ප්‍රතිපත්ති නිසාද තම නිෂ්පාදන දේශීය හා ජාත්‍යන්තර වෙළඳපලට සැපැයීම සඳහා ව්‍යවසායකයින් බිහි වීම දක්නට ඇත. එසේම ශ්‍රී ලංකාවේ එක් එක් දේශපාලන ප්‍රතිපත්ති අනුව ක්‍රියාත්මක වූ ජාතික වැඩසටහන් මගින් දේශීය සම්පත් හා දැනුම උපයෝගී කරගනිමින් සුළු පරිමාණ කර්මාන්ත හා සේවා ආරම්භ කිරීම සඳහා මඟ පෙන්වන ක්‍රියාකාරකම් තුලින් ග්‍රාමීය ව්‍යවසායකයින් බිහිවී ඇත. මෙම වැඩසටහන් ලෙස ජනසවිය, සමෘද්ධි, ගමනැගුම හා දිවිනැගුම යන වැඩසටහන් පෙන්වා දිය හැකිය. ජාත්‍යන්තර දර්ශකයක් වන ව්‍යාපාර පවත්වාගෙනයාමේ දර්ශකයට අනුව ලෝකයේ රටවල් 189ක් අතරින් ශ්‍රී ලංකාව 107 වැනි ස්ථානය 2015 වසරේදී හිමිකරගෙන ඇත (Doing Business 2016) . මෙම දර්ශකයට අනුව පෙන්නුම් කරන්නේ ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්වයට ඉහල ස්ථානයක් හිමිවී ඇති බවයි. රටක අභිවෘද්ධිය සඳහා නවෝත්පාදන සිදුකිරීම, සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම, රැකියා ජනනය, පාරිභෝගික අවශ්‍යතා ඉටු කිරීම හා ආදායම් උත්පාදනය වැනි කරුණු

නිසා ව්‍යවසායකයාට ශ්‍රී ලංකාවේ හිමිවන්නේ අද්විතීය ස්ථානයකි (www.doing business.com) . දෙවන ලෝක යුද්ධයෙන් පසු ජපානය වැනි රටවල් ලෝක ආර්ථිකයේ බලවතකු වීමට ඇති රහස ව්‍යවසායකත්වයයි (The Business සඟරාව) .

එසේම වර්තමානයේ සංවර්ධිත රටවල් වන කොරියාව, මැලේසියාව, සිංගප්පූරුව සහ හොංකොං වැනි රටවල් සාර්ථක වීමට හේතුව ව්‍යවසායකත්ව නැඹුරුවකින් කටයුතු කිරීම නිසාය. රටක් ගත්කල මහාපරිමාණ ව්‍යවසායකයින් හෝ නිෂ්පාදකයින් එකවරම බිහිවන්නේ නැත. ආරම්භ වන්නේ ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයාගෙන්ය. ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින මහා පරිමාණ ව්‍යවසායකයින් ඉතා කුඩාවට පටන්ගෙන පවත්වාගෙන ආ ව්‍යාපාර බව, සිද්ධාලේප, නවලෝක, දාස වැනි ව්‍යාපාර පෙන්වා දෙයි. ලංකාවේ ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයින් රටේ ආර්ථිකය ගොඩනඟන මුර දේවතාවන් සේ සැලකිය යුතුය. එම නිසා සුළු පරිමාණ ව්‍යවසායකයින් නඟාසිටුවීම සඳහා අවශ්‍ය වැඩසටහන් දියත් කිරීම රටේ ප්‍රධාන කාර්යභාරයක් විය යුතුය. ව්‍යවසායකයා නැතිනම් ව්‍යවසායකත්වය පහසු කර්යයක් නොව එය පුද්ගලයින්ගේ හැකියා, දක්ෂතා සහ කුසලතා අනුව ඇතිවන තත්ත්වයකි. එම නිසා ව්‍යවසායකයා යන්න විවිධ පැති ඔස්සේ විද්වතුන් නිර්වචනය කර ඇත.

1. "ව්‍යවසායකයා අවධානම් දරන්නෙකි - Risk taker "

   Cantillon - 1775

2. "ව්‍යවසායකයා සංවිධායකයෙකි - Organizer "
   නිෂ්පාදන සාධක සංයෝග කරනු ලබන ආර්ථික නියෝජිතයෙකි

   J. B. Say

3. "ව්‍යවසායකයා නවෝත්පාදන සිදුකරන්නෙකි - Innovator "
   නවෝත්පාදන තුලින් ලාභ උපරිම කිරීමට උත්සහ කරන ආර්ථික මිනිසෙකි.

   J. A. Schumpeter - 1991

4. " ව්‍යවසායකයා නිතරම වෙනසක් සොයන ඊට ප්‍රතිචාර දැක්වීමෙන් එය තමාගේ වානිජමය අවස්ථාවක් බවට පත්කර ගන්නෙකි "

   Peter Druker

(ශ්‍රී ලංකා කාර්මික මණ්ඩලය - ප්‍රකාශන)

ව්‍යවසායකයින් මුහුණදෙන ප්‍රශ්න, ගැටළු සහ අවශ්‍යතාවයන් බොහෝමයකි. නිෂ්පාදන සාධක වන භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය හා ව්‍යවසායකත්ව හැකියාව ව්‍යාපාරයක් සඳහා අත්‍යාවශ්‍ය සාධකයි. ඒ අතරින් ඔවුන්ගේ ප්‍රාග්ධන අවශ්‍යතාවය නැතහොත් මූල්‍ය ශක්තිය ප්‍රධාන තැනක් ගන්නා අතර ඒ මත එම ව්‍යාපාරයේ සාර්ථකත්වය හා පැවැත්ම රඳා පවතී. ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයින්ගේ මූල්‍ය අවශ්‍යතා ඉටුකර දීම සඳහා පුද්ගල, ආයතන හා සංවිධාන විධිමත් හා අවිධිමත් ආකාරයෙන් ග්‍රාමීයව සම්බන්ධ වීම බහුලව දක්නට ලැබෙන තත්ත්වයකි. එවැනි තත්ත්වයන් මත ඔවුන්ගේ ක්ෂුද්‍ර මූල්‍ය අවශ්‍යතා ඉටුවන හා ඉටුකරගන්නා ආකාරය දෙස විමර්ෂණාත්මකව බැලීම කාලෝචිත කරුණකි.

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය මට්ටමින් ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සැපයීම සඳහා පුද්ගලයින්, ආයතන, සංවිධාන හා බැංකු බොහෝමයක් ගමට සම්බන්ධ වන බව දක්නට ලැබේ. මේ අතර අවිධිමත් පුද්ගලයින්ගේ හා සංවිධානවල ගොදුරු බවට ග්‍රාමීය ව්‍යවසායකයින් පත්වී ඇත. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයින්ගේ ක්ෂුද්‍ර මූල්‍ය අවශ්‍යතා ඉටුකිරීම සඳහා රාජ්‍ය අංශයේ මැදිහත් වන ප්‍රමුඛ මූල්‍ය ආයතන බවට සමෘද්ධි බැංකුව පත්වී ඇත. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ක්ෂුද්‍ර මූල්‍ය අවශ්‍යතාවයෙන් ඉහළ දායකත්වයක් සමෘද්ධි බැංකුව මගින් ලබා දීමට සමත් වී ඇත. ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම ආයතනය සමෘද්ධි බැංකු ජාලය බව මුදල් අමාත්‍යංශයේ GTZ මගින් 2008 වසරේ කරන ලද සමීක්ෂණයෙන් හෙළිදරව් කරගෙන ඇත. (සමෘද්ධි අමාත්‍යංශයේ ප්‍රකාශන - 2017)

1995 වර්ෂයේ දී සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන හඳුන්වාදෙන ලද්දේ ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයින් නගාසිටුවීම තුලින් දුප්පත්කම අඩුකිරීම පරමාර්ථ ඇතිවය. ශ්‍රී ලංකාවේ දිළිඳු ජනතාවට සමෘද්ධි වැඩසටහන තුළින් ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සපයන ලද්දේ නව්‍යකරණ ක්‍රමයක් ලෙස දුප්පත්කම අඩු කිරීම සඳහා බව සමෘද්ධි වැඩසටහන පිළිබඳ අමාත්‍යංශ ප්‍රකාශන වල සටහන්ව ඇත. ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සැපයීම තුලින් සමෘද්ධි වැඩසටහන බලාපොරොත්තු වූයේ ග්‍රාමීය දුප්පතුන් සමාජ සජීවිකරණ ක්‍රියාවලියක් තුලින් නවෝත්පාදන සිදුකරමින් ඉතිරි කිරීම් හා ආයෝජන වර්ධනය සිදුවී ඔවුන්ගේ ව්‍යාපාර දියුණු වී දුප්පත්කමින් මුදවා ගැනීමය (සමෘද්ධි ප්‍රකාශන - 2016)www.samurdhi.gov.lk). සමෘද්ධි


වැඩසටහන තුලින් ශ්‍රී ලංකාවේ දුප්පත්කම 1995 තිබූ 30% ප්‍රතිශතය 2013 වන විට 6.7% දක්වා අඩු කිරීමට හැකි වී ඇත (නදීකා දමයන්ති - Asia Politics).

වගුව 01

ශ්‍රී ලංකාවේ දුප්පත්කම

| වර්ෂය | දුප්පත්කම |
|---|---|
| 1995/96 | 28.8 |
| 2002 | 22.7 |
| 2006/07 | 15.2 |
| 2009/10 | 8.9 |
| 2012/13 | 6.7 |

ප්‍රස්ථාරය 01




මූලාශ්‍රය - ජන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(App Asian Politics & Policy)

සමෘද්ධි වැඩසටහන යටතේ ජීවනෝපාය සංවර්ධනය සඳහා ග්‍රාමීය ව්‍යවසායකයන්ගේ දියුණුව වෙනුවෙන් විශාල මූල්‍ය දායකත්වයක් ලබා දී ඇත. ඔවුන්ගේ මූල්‍ය අවශ්‍යතා සඳහා ණය, ව්‍යාපාර දියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන්, වෙළඳපල සොයා දීම හා ඒ සඳහා වෙළඳ ප්‍රදර්ශන වැඩසටහන් තුළින් දායක වී ඇත. එසේම ක්ෂුද්‍ර ණය පහසුකම් සඳහා අඩු පොලී අනුපාතයන් යටතේ පහසුකම් ලබා දී ඇත්තේ සමෘද්ධි බැංකුව තුලිනි. සමෘද්ධි වැඩසටහන හරහා ඔවුන්ගේ චක්‍රීය අරමුදලක් ඇතිකර ඒ තුළින් ඔවුන්ගේ ක්ෂුද්‍ර මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමට පහසුකම් සලසා ඇත. එසේම තෝරාගත් ව්‍යවසායකයින් සඳහා විශේෂ ණය ආධාර ක්‍රමයක් තුළින් ඔවුන්ට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර ලබා දී ඇත. මෙහිදී 50% දායකත්වය සහ 100% සහනාධාර ක්‍රමයටද පහසුකම් සපයා ඇත. සමෘද්ධි වැඩසටහන තුළින් ජීවනෝපාය සංවර්ධනය සඳහා 1997 දී රු. 610,738 සිට 2014 දී රුපියල් මිලියන 7092.95 දක්වා පහසුකම් ලබා දී ඇත (නදීකා දමයන්ති . APP. Politics & Policy – 2016).

## 1.2 කාලීන අවශ්‍යතාවය

- 1995 සිට මේ දක්වා සමෘද්ධි වැඩසටහන් මඟින් ග්‍රාමීය සුළු පරිමාන ව්‍යවසායකයින්ගේ ක්ෂුද්‍ර මූල්‍ය අවශ්‍යතාවයන් සඳහා දායක වී ඇති ආකාරය පිළිබඳ සොයා බැලීම කාලීන වශයෙන් වැදගත්ය.

- සමෘද්ධි බැංකුව මගින් ක්ෂුද්‍ර මූල්‍ය අධීක්ෂණය හා නිගමනය වන ආකාරය පිළිබඳ අධ්‍යනය කිරීම කාලීන අවශ්‍යතාවයකි.

- ග්‍රාමීය සුළුපරිමාණ ව්‍යවසායකයින්ගේ ගැටළු සොයා බැලීමට සහ ඔවුන්ගේ අවශ්‍යතාවයන් පිළිබඳ අධ්‍යයනයක් කිරීම ජාතික වැදගත්කමක් ලෙස දැකිය හැකිය.

## 1.3 අරමුණු

- ❖ ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යාවසායකයින්ගේ ක්ෂුද්‍ර මූල්‍ය අවශ්‍යතා ඉටුකර ගැනීමේදී සමෘද්ධි බැංකුවේ දායකත්වය කොතෙක්ද යන්න හඳුනාගැනීම.
- ❖ ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයින් සඳහා සමෘද්ධි බැංකුව ලබාදෙන ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් මොනවාද යන්න හඳුනාගැනීම සහ එම ක්‍රමවේදය අධ්‍යනය කිරීම.
- ❖ සමෘද්ධි බැංකුවේ ක්ෂුද්‍ර මූල්‍ය දායකත්වය තුලින් ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයා ගොඩනැගුණු ආකාරය පිළිබඳ විග්‍රහ කර ගැනීම.
- ❖ සමෘද්ධි බැංකුවේ ක්ෂුද්‍ර මූල්‍ය අධීක්ෂණය හා නියාමන වැඩ පිළිවෙල හඳුනාගැනීම.
- ❖ ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයින් මුහුණදෙන ක්ෂුද්‍ර මූල්‍ය ප්‍රශ්න හා ගැටළු හඳුනාගැනීම.

## 1.4 අධ්‍යයන ක්‍රමවේදය

### 1.4.1. දත්ත රැස් කිරීම

මෙම අධ්‍යනයේදී ප්‍රාථමික හා ද්විතික යන දෙවර්ගයේම දත්ත රැස්කර ගන්නා ලදි.

#### 1.4.1.1. නියදිය තෝරා ගැනිම.

උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සමෘද්ධි කලාප වලින් ගොඩනැගුනු ව්‍යවසායකයින් 10 දෙනෙකු මූලික අධ්‍යයනය සඳහා නියැදි වශයෙන් තෝරාගන්නා ලදි. මෙම ව්‍යවසායකයින් දස දෙනා විවිධ ව්‍යාපාර වල නිරත වන ව්‍යවසායකයින් වේ. එම ව්‍යාපාර ලෙස, රසකැවිලි, ලී බඩු, හාල්පිටි, මිරිස්කුඩු සහ තුනපහ කුඩු, පිත්තල භාණ්ඩ නිෂ්පාදන, ලී කැටයම්, සපත්තු, විසිතුරු මල්, බෙර නිෂ්පාදනය, බෑග් නිෂ්පාදනය මේ අතර වේ. මෙම නියැදි අතරින් සමෘද්ධි බැංකුව මගින් ක්ෂුද්‍ර මූල්‍ය අවශ්‍යතා සපුරාගනීමින් ඉතා සාර්ථකව ගොඩනැගුණු එක් ව්‍යවසායකයෙකු පිළිබඳ ගැඹුරින් අධ්‍යයනය කරන ලදි. එම අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලද්දේ කලේ ඉතා අසරණ තත්වයේ සිට ගොඩනැගුණු ගෙලිඔය සමෘද්ධි කලාපයේ

දෙහිපාගොඩ වසමේ පදිංචි හාල්පිටි, මිරිස් කුඩු, තුනපහ කුඩු සහ විලිපේස්ට් නිෂ්පාදනය කරන කේ.ජී. රන්මැණිකේ මහත්මියගේ ව්‍යාපාරයයි.

### 1.4.1.2. ප්‍රාථමික දත්ත රැස් කිරීම

තෝරාගත් ව්‍යවසායකයින්ගෙන් සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් සහ සහභාගීත්ව නිරීක්ෂණය තුලින් ප්‍රාථමික දත්ත ලබාගන්නා ලදි. මේ සඳහා ව්‍යවසායකයින්ගේ විවිධ පැතිකඩ ඔස්සේ දත්ත හා තොරතුරු ලබා ගන්නා ලදි. ව්‍යවසායකයින් ගොඩනැගුණු ආකාරය පිළිබඳ ඔවුන්ගේ ව්‍යාපාරික ස්ථාන සහ කර්මාන්ත වැඩබිම් නිරීක්ෂණය තුලින් දත්ත රැස්කර ගන්නා ලදි.

### 1.4.1.3. ද්විතීක දත්ත රැස් කිරීම

- උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සැලසුම් අංශය සහ සමෘද්ධි අංශයේ ඇති ලිපිගොනු වලින් තොරතුරු ලබා ගන්නා ලදි.

- උඩුනුවර සමෘද්ධි මහාසංගමයේ ඇති දත්ත හා තොරතුරු අධ්‍යයනය සඳහා භාවිතා කරන ලදි.

- සමෘද්ධි බැංකුවේ ඇති ලිපි ගොනු වලින් තොරතුරු ලබා ගන්නා ලදි.

- නියැදිය ලෙස තෝරාගත් ව්‍යවසායකයින් විසින් තබාගත් වාර්තා සහ ලිපි ලේඛන වලින් අවශ්‍ය තොරතුරු ලබා ගන්නා ලදි.

- ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ ප්‍රකාශන වලින් ලබාගත් දත්ත සහ තොරතුරු.

- ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රකාශන වලින් ලබාගත් දත්ත හා තොරතුරු.

- අන්තර්ජාලය මගින් ලබාගත් දත්ත හා තොරතුරු.

- ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ පුස්තකාලයේ ඇති පොත් හා වාර්තා තුලින් තොරතුරු ලබා ගන්නා ලදි.

### 1.4.2. දත්ත විශ්ලේෂණය

මෙම අධ්‍යයනයේදී දත්ත විශ්ලේෂණය සඳහා විවිධ ක්‍රම උපයෝගී කර ගන්නා ලදි. මෙහිදී ප්‍රධාන ගැටලුව වන සමෘද්ධි බැංකුව ග්‍රාමීය සුළු පරිමාණ

ව්‍යවසායකයින් සඳහා ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සක්‍රියව ලබා දෙන්නේද? යන්න පිළිබඳ විශ්ලේෂණය කරගන්නා ලදි. ඒ සඳහා ප්‍රශ්න පහක් ඔස්සේ ක්ෂේත්‍රයෙන් ලබාගන්නා දත්ත හා තොරතුරු අනුව විශ්ලේෂණය කර අධ්‍යයනය සිදුකරන ලදි. ප්‍රධාන ගැටලුව විශ්ලේෂණය කර ගැනීම සඳහා යොදාගත් ප්‍රශ්න ලෙස, සමෘද්ධි බැංකුව මගින් ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයින් සඳහා ලබා දෙන ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් මොනවාද? ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයින්ගේ ක්ෂුද්‍ර මූල්‍ය අවශ්‍යතා ඉටුවන්නේ කෙසේද? සමෘද්ධි බැංකුව මගින් ලබාදෙන ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් අධීක්ෂණය හා නියාමනය කරන්නේ කෙසේද? සහ ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයින් මුහුණදෙන ක්ෂුද්‍ර මූල්‍ය ප්‍රශ්න හා ගැටලු මොනවාද? ආදී පර්යේෂණ ප්‍රශ්න ඔස්සේ ලබාගත් දත්ත හා තොරතුරු විශ්ලේෂණය කොට අධ්‍යයනය සිදුකරන ලදි.

ව්‍යවසායකයින්ගේ ව්‍යාපාරය විශ්ලේෂණයේදී ස්වොට් (SWOT) විශ්ලේෂණ ක්‍රමවේදය භාවිත කරන ලදි. එහිදී ඔවුන්ගේ ව්‍යාපාර වල ඇති ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන පිළිබඳ වෙන වෙනම විශ්ලේෂණය කර නිගමන වලට එළඹෙන ලදි.

### 1.4.3. අධ්‍යයනයේ සීමා

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ක්ෂුද්‍රමූල්‍ය, ක්ෂුද්‍රමූල්‍ය ආයතන හා ග්‍රාමීය ව්‍යවසායකයින් පුළුල් පරාසයක් තුල දිවෙන මාතෘකාය. එම මාතෘකා ඔස්සේ අධ්‍යයනය කිරීමේදී පහත සඳහන් සීමාවන්ට යටත් වීමට සිදුවිය.

- ❖ ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයින් මුළු රටතුලම ව්‍යාප්ත වී සිටින බැවින් එක් එක් ප්‍රදේශයකට පමණක් සීමා විය.
- ❖ ග්‍රාමීය සුළුපරිමාණ ව්‍යවසායකයින්ගේ මූල්‍ය අවශ්‍යතා ඉටු කරන ආයතන අතරින් එක් ආයතනයකට පමණක් සීමා කිරීම.
- ❖ ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර විශ්ලේෂණයේදී ඔවුන් ගිණුම් වාර්තා තබා නොගැනීම නිසා විශ්ලේෂණය අපහසු වීම.
- ❖ ක්ෂේත්‍රයට අදාළ තොරතුරු හා වාර්තා අවම මට්ටමක පැවතීම.

# දෙවෙනි පරිච්ඡේදය

## 2.1 හැඳින්වීම

උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයින් විවිධ ව්‍යාපාරික ක්ෂේත්‍ර වල නියැලී සිටිති. ඒ අතරින් සම්ප්‍රදායික කර්මාන්ත ක්ෂේත්‍ර වලද නියැලී සිටින අය දක්නට ඇති ලක්ෂණයකි. පිත්තල හා ලී කැටයම් ආශ්‍රිතව අත්කම් හා ලාක්ෂා කර්මාන්තයේ නියැලී සිටින සුළු පරිමාණ ව්‍යවසායකයින් ද වේ.

සමෘද්ධි වැඩසටහන මගින් උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ අඩු ආදායම්ලාභීන්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම සඳහා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන තුළින් ව්‍යවසායකයින් බිහිකර ඇත. ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා සමෘද්ධි බැංකුව මගින් ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සපයා දී ඇති අතර. සත්ත්ව පාලනය, කර්මාන්ත සංවර්ධනය, කෘෂි සංවර්ධනය සහ අලෙවිය හා සේවා යන අංශ මගින් ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයින් සඳහා පහසුකම් සලසා ඇත.

### 2.1.1. උඩුනුවර කොට්ඨාශයේ සමෘද්ධි වැඩසටහන මගින් ක්‍රියාත්මක ජීවනෝපාය සංවර්ධන වැඩසටහන්.

කර්මාන්ත - බිලොක් ගල්, මැටල්, කළුගල් ආශ්‍රිත නිෂ්පාදන, පිත්තල නිශ්පාදන, ලී කැටයම්, සංගීත භාණ්ඩ, කුළු හා විසිතුරු සතුන්, මූර්ති කැටයම්, සෙරෙප්පු හා සපත්තු නිෂ්පාදන, සම්භාණ්ඩ, දියතෙරෙප්පු කණ්නාඩි, කොසු ඉදල්, සුවඳ කූරු, බෑග් නිෂ්පාදන, ඇඳුම් මැසීම, වඩු කර්මාන්තය, යෝගට් නිෂ්පාදනය, කිරිටොෆි, බයිට්, රසකැවිලි, හාල්පිටි, තුනපහ ආදිය.

කෘෂිකාර්මික නිෂ්පාදන - විසිතුරු මල් වගාව, අපනයන බෝග පැල තවාන්, බිම්මල් වගාව, ඇසුරුම් නිෂ්පාදන

සත්ත්ව පාලන හා ධීවර - කිරිගව ව්‍යාපෘති, එළු පාලනය, කුකුළු පාලනය, මිරිදිය ධීවර, විසිතුරු මසුන් ව්‍යාපෘති, කිරි ආශ්‍රිත අතුරු නිශ්පාදන.

ආදී විවිධ ව්‍යාපාර ක්ෂේත්‍ර සදහා සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහනකින් සුළු පරිමාණ ව්‍යවසායකයන් සදහා පහසුකම් සපයා ඇත.

## 2.1.2. උඩුනුවර කොට්ඨාශය තුල ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන

උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ග්‍රාමීය ව්‍යවසායකයින්ගේ මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සදහා බොහෝ ආයතන හා සංවිධාන ක්‍රියාත්මක වේ. ඒ අතර රාජ්‍ය ආයතන, පෞද්ගලික බැංකු හා අනෙකුත් ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ ග්‍රාමීය මට්ටමෙන් බිහිවී ඇති අවිධිමත් සංවිධාන හා පුද්ගලයින් දක්නට ඇත. වර්ල්ඩ් විෂන්, බෙරුන්ඩිනා, සහ කාන්තා සංවිධාන රාජ්‍ය නොවන අංශයෙන් ග්‍රාමීය ව්‍යවසායකයින් සදහා ක්ෂුද්‍ර මූල්‍ය අවශ්‍යතා ඉටු කිරීම සදහා උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වැඩි වශයෙන් සම්බන්ධවන බව දක්නට ලැබේ. එසේම සෙලින්කෝ ග්‍රාමින්, HNB ග්‍රාමින්, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, කොමර්ෂල් ක්‍රෙඩිට්, ලංකා පුත්‍ර ආදී බැංකු හා අනෙකුත් සංවිධාන වලින් ග්‍රාමීය ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සැපයීම සදහා ග්‍රාමීය මට්ටමින් සම්බන්ධ වී ඇත. එසේම ගම්මාන වල විවිධ කණ්ඩායම් හා පුද්ගලයින්ද ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයින් සදහා මූල්‍ය පහසුකම් සැපයීම දක්නට ලැබේ. 1995 සිට රාජ්‍ය අංශයේ ණය වැඩසටහනක් හරහා දීර්ඝ කාලයක් සිට ග්‍රාමීය ව්‍යවසායකයින් සදහා ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සැපයෙන බැංකුව ලෙස සමෘද්ධි බැංකුවද ක්‍රියාත්මක වේ. ඉහත සඳහන් කල සංවිධාන, ආයතන හා පුද්ගලයින් හරහා ක්‍රියාත්මක වන ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් වල පහත ලක්ෂණ දක්නට ඇති බව ක්ෂේත්‍රය තුලින් අනාවරණය විය.

- ඉතා අධික පොලී අනුපාතය මාසික පොලිය 5% සිට 20% දක්වා එය වාර්ෂික පොලිය $5 X 12 = 60\%$සහ $20 X 12 = 240\%$ ආදී ලෙසයි.
- සති ණය නිසා වාරික ගෙවීම අපහසුය.
- ව්‍යාපාර බිඳ වැටීම (ලාභය සතියෙන් සතිය පොලිය ලෙස ගෙවීම නිසා).
- ණය උගුලට හසු වීම.
- අනවශ්‍ය කොන්දේසි.
- පවුල් ආරවුල් ඇති වීම.
- සිය දිවි නසා ගැනීම හා ගැටුම් ආදිය සඳහන් කල හැකිය.

### 2.1.3. උඩුනුවර කොට්ඨාසයේ සමෘද්ධිය වැඩසටහන තුලින් ව්‍යවසායකයාට ලැබී ඇති ප්‍රයෝජන

සමෘද්ධි වැඩසටහන හරහා උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති සුළු පරිමාණ ව්‍යවසායකයින් වෙනුවෙන් බොහෝ වැඩසටහන් ක්‍රියාත්මක වී ඇත. අඩු ආදායම්ලාභීන් සඳහා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන හරහා ව්‍යවසායකත්ව හැකියා සහ සම්පත් ඇති අයට අඩු පොලී අනුපාතයට ණය ලබා දී ව්‍යාපාර ආරම්භ කිරීමට අවස්ථාව ලබා දී තිබේ. අඩු ආදායම් ලාභී පවුල් වල ආදායම් මට්ටම් ඉහල දැමීම, සෞඛ්‍ය හා පෝෂණ මට්ටම උසස් කිරීම මෙන්ම රැකියා වෙළඳපලට උචිත පුහුණු ශ්‍රමිකයන් සැපයීම සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම මෙම වැඩසටහනේ අරමුණ වී ඇත (සමෘද්ධි අධිකාරියේ කාර්ය සාධන වාර්තාව 2015). කෘෂිකර්මාන්තය,සත්ත්ව පාලනය, ධීවර සහ කර්මාන්ත යන ක්ෂේත්‍ර වල නිෂ්පාදිතය ඉහළ දැමීම සහ නව රැකියා උත්පාදනය තුලින් සමෘද්ධි ප්‍රතිලාභි හා අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා 2015 වර්ෂයේදී සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යංශය විසින් පහත පරිදි ප්‍රතිපාදන වෙන් කර ඇත.

| | රු. මි. |
|---|---|
| 1. ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් | 1015.00 |
| 2. දුප්පත්කම දුරලීමේ වැඩසටහන | 688.80 |
| 3. ජීවනෝපාය චක්‍රිය ණය වැඩසටහන | 477.00 |
| **මුළු ප්‍රතිපාදන ප්‍රමාණය** | 2180.80 |

ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් හරහා ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ග්‍රාමීය ව්‍යවසායකයන් වෙත ලැබී ඇත. මෙම වැඩසටහන යටතේ රු. 75 000 කට උපරිමයකට යටත්ව ව්‍යවසායකයන්ට මුදල් ලබා දීම සිදු කරනු ලැබේ. සමෘද්ධි වැඩසටහන තුලින් ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයින් සඳහා ලබා දෙන ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් අතර ' ප්‍රදානයක් ' ලෙසද මූල්‍ය පහසුකම් සපයන බව අනාවරණය

විය. ව්‍යාපෘති අනුව ලබා දෙන ප්‍රදානයේ ප්‍රතිශතයන් වෙනස් වේ. ඇතැම් ව්‍යාපෘති සඳහා 90% ක ප්‍රදානයක් සිට 50%, 40%, 10% ලෙස මූල්‍ය පහසුකම් ලබාදී ඇත.

ග්‍රාමීය සුළු පරිමාන ව්‍යවසායකයින් සඳහා සමෘද්ධිය ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් වලින් ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ලබාදීම 2015 වර්ෂයේදී මහනුවර දිස්ත්‍රික්කයේ රු. මි. 21.36 ලෙස පෙන්නුම් කර ඇත (කාර්ය සාධන වාර්තාව - 2015/සමෘද්ධි).

සමෘද්ධි වැඩසටහන මගින් ග්‍රාමීය ව්‍යවසායකයින් සඳහා ණය ලබා දීමට අමතරව පහත සඳහන් සේවාවන් සහ වැඩසටහන්ද ක්‍රියාත්මක කර ඇත.

2015 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වැඩසටහන් පහත පරිදි සමෘද්ධි කාර්ය සාධන වාර්තාවේ සඳහන්ව ඇත.

- ජංගම අලෙවි රථ හා ජංගම අලෙවි කුටි සංවර්ධන වැඩසටහන.
- ගෘහස්ථ ගබඩා සංවර්ධනය කිරීමේ වැඩසටහන.
- ව්‍යාපාර සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම, ව්‍යවසායක දැනුම වර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන.
- අලෙවි ප්‍රදර්ශන වැඩසටහන.
- සතිපොල වෙත නිෂ්පාදකයින් යොමු කිරීමේ වැඩසටහන.
- සමෘද්ධි ව්‍යාපාරික සංගම් පිහිටුවීම.

මෙම වැඩසටහන්ද උඩුනුවර කොට්ඨාසයේ ද ක්‍රියාත්මක වී ඇති බව අධ්‍යයනයේ දී හෙළිදරව් විය. මෙම වැඩසටහන් තුලින් ග්‍රාමීය ව්‍යවසායකයින් දිරිමත් වන බව තොරතුරු ලබා දුන් නිලධාරීන්ගෙන් සහ ව්‍යවසායකයින්ගෙන්ද අනාවරණය විය.

## 2.2 අධ්‍යයන ප්‍රදේශයේ පසුබිම

### 2.2.1. භූගෝලීය පිහිටීම

උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය විවිධ භූවිෂමතා ලක්ෂණ වලින් යුක්ත මනරම් ප්‍රදේශයකට උරුමකම් කියයි. දෙස් විදෙස් සංචාරකයින්ගේද ඇස් පිනවන සිත් ඇදගන්නා වූ ප්‍රදේශයක් වීම නිසාද ව්‍යවසායකයින්ගේ හොඳ ව්‍යාපාරික පසුබිමකට ස්වභාවයෙන්ම උරුම වූ දායාදයකි. කඳු සහ නිම්න ලක්ෂණ වලින් සමන්විත වන නිසා මනරම් දියපහරවල් සහ කුඩා ප්‍රමාණයේ ජලාශ රාශියක්

දක්නට ඇත. උතුරින් පේරාදෙණිය කඩුගන්නාව දක්වා මාර්ග සහිත යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයද නැගෙනහිරින් මහවැලි ගඟෙන් වෙන් වන ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයද දකුණින් උඩපලාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයද බටහිරින් කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයද පිහිටා ඇත. මධ්‍යම පලාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පෞරාණිකව වටිනා ස්ථාන වන ගඩාලාදෙණිය, ඇම්බැක්ක පිහිටා ඇත්තේ ද උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුලය. ව්‍යවසායකත්වයට උචිත පොදු පහසුකම් සහිත සහ ප්‍රධාන වෙළඳ නගරය වන මහනුවරට ආසන්නයෙන් පිහිටා තිබීමත් ව්‍යවසායකයින්ගේ දියුණුවට ඉතා යෝග්‍ය පසුබිමකි.

## 2.2.2. උඩුනුවර කොට්ඨාශයේ මූලික දත්ත හා තොරතුරු


1. කොට්ඨාශයේ වර්ගඵලය -
    - වර්ග කි. මී. - 65.3
    - වර්ග සැතපුම් - 25.21
    - හෙක්ටයාර් - 6530
    - අක්කර - 16136
2. ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව - 124
3. ගම් සංඛ්‍යාව - 247
4. මුළු පවුල් සංඛ්‍යාව - 30958
5. මුළු නිවාස සංඛ්‍යාව - 29466
6. මුළු ජනගහනය - 121360
    - ස්ත්‍රී - 62043
    - පුරුෂ - 59317

ජාතීන් අනුව ජනගහනය (පවුල් වශයෙන්)

| | |
|---|---|
| සිංහල | 23627 |
| මුස්ලිම් | 6615 |
| දෙමළ | 649 |
| බර්ගර් | 60 |

| | |
|---|---|
| වෙනත් | 7 |
| එකතුව | 30958 |

මූලාශ්‍රය : උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - සංවර්ධන අංශය සම්පත් පැතිකඩ



මූලාශ්‍රය : උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - සංවර්ධන අංශය සම්පත් පැතිකඩ

### 2.2.3. අධ්‍යයන නියැදියේ පසුබිම

අධ්‍යයනය සඳහා උඩුනුවර කොට්ඨාශයෙන් මූලික නියැදිය ලෙස සමෘද්ධි වැඩසටහනෙන් ගොඩනැගුණු ව්‍යවසායකයින් දස දෙනෙකු තෝරා ගන්නා ලදි. ව්‍යවසායකයින් දස දෙනා තෝරාගැනීමේදී උඩුනුවර සමෘද්ධි මහාසංගමයේ නිර්ණායකයන්ට අනුව ඔවුන් විසින් ලබා දුන් ව්‍යවසායකයින් තෝරාගන්නා ලදි.

**මූලික අධ්‍යයනය සඳහා තෝරාගත් ව්‍යවසායකයින්**

| අනු අං. | ව්‍යවසායකයාගේ නම | සමෘද්ධි කලාපය | වසම | නිෂ්පාදන කේෂ්ත්‍රය/ ව්‍යාපාරය |
|---|---|---|---|---|
| 1 | මධුෂා දිල්ශානි | ගඩලාදෙණිය | යාලේගොඩ නැ. | රසකැවිලි |
| 2 | කේ.කේ.පී. සුමිත් රණසිංහ | බඹරදෙණිය | බඹරදෙණිය | ලී බඩු |
| 3 | කේ.පී. රම්මැණිකේ | ගෙලිඔය | දෙහිපාගොඩ | හාල්පිටි, මිරිස්, තුනපහ කුඩු වර්ග නිෂ්පාදනය |
| 4 | පී.එන්. රත්නවතී | ඉබුල්දෙණිය | ගඩලාදෙණිය | පිත්තල බඩු |
| 5 | විරාජ් චන්දිම දෙවනආරච්චි | බඹරදෙණිය | සියඹලාගොඩ | ලී කැටයම් කර්මාන්තය |
| 6 | එම්.සී.එම්. ඉර්ෂාඩ් | දවුලගල | පෙතියාගොඩ | සපත්තු |
| 7 | නන්දා පත්මසිරි | ගංහත | ගංහත | විසිතුරු මල්පැල |
| 8 | කේ. ශ්‍රියාලතා | වැලිගල්ල | කුරගල | බෙර නිෂ්පාදනය |
| 9 | ජේ.එම්. ටිකිරි බණ්ඩා | හන්දෙස්ස | මැද්දේගොඩ | මිරිස්, තුනපහ |
| 10 | කේ.පී. තිලකාවතී | බඹරදෙණිය | බෙරවල නැ. | බෑග් නිෂ්පාදනය |

මූලික විමර්ෂණයේදී ඉහත සඳහන් ව්‍යවසායකයින් දස දෙනා පිළිබඳ අධ්‍යයනයක් කරන ලදි. එම අධ්‍යයනය සිදු කරන ලද්දේ තෝරාගත් ව්‍යවසායකයින් සැබෑ ලෙස සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන තුලින් ගොඩනැගුණු ව්‍යවසායකයන්ද?

ඔවුන්ගේ ආරම්භය කෙසේද? කුමන මට්ටමෙන් පවත්වාගෙන යන ව්‍යාපාරද? ක්ෂුද්‍ර මූල්‍ය අවශ්‍යතා සපුරා ගන්නා ලද්දේ කොයි ආකාරයටද? සමෘද්ධි වැඩසටහන ලබා දුන් දායකත්වය කෙසේද? යන්න පිළිබඳ විමර්ෂණය කරන ලදි. මෙම අධ්‍යයනයෙන් පසු සමෘද්ධි වැඩසටහනේ ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහත් සමග ගොඩනැගුණු ව්‍යවසායකයන් පස් දෙනෙකු තෝරාගන්නා ලදි. එසේ තෝරාගත් ව්‍යවසායකයින් පහත පරිදි දැක්විය හැකිය.

**01. ව්‍යවසායකයා : මධූෂා දිල්ශානි මහත්මිය**

| | | |
|---|---|---|
| ව්‍යාපාරය | :- | රසකැවිලි නිෂ්පාදන |
| ලිපිනය | :- | නවරස නිෂ්පාදන, 340/D/7, යාලේගොඩ, හන්දෙස්ස. |
| දුරකථන අංක | :- | 077 - 4141478 / 070 - 2962670 |
| සමෘද්ධි කලාපය | :- | ගඩලාදෙණිය |
| ආරම්භය | :- | 2012 වර්ෂය |

මධූෂා දිල්ශානි මහත්මිය ආර්ථික අපහසුතා මැද ජීවත් වූ විවාහක දරුවන් තිදෙනෙකු සිටින කාන්තාවකි. ව්‍යාපාරය සඳහා ආරම්භක අඩිතාලම වැටී ඇත්තේ සමෘද්ධි සංවර්ධන නිලධාරී තුමියගේ මඟපෙන්වීම මතය. මධූෂා තුල තිබූ ස්වශක්තියෙන් නැගිටීමට ඇති හැකියාව හඳුනාගත් ඇය ව්‍යාපාරය ආරම්භය සඳහා අදහස සහ සමෘද්ධිය වැඩසටහනේ දායකත්වය ලබා දී ඇත. රු. 5000 ආරම්භක ණය මුදලින් මෙම ව්‍යාපාරය පටන් ගෙන වර්තමානයේ රු. 250 000 ණය ප්‍රමාණය දක්වා ලබාගෙන ව්‍යාපාරය පවත්වාගෙන යන දිරිය කාන්තාවකි. සමෘද්ධි වැඩසටහන තුළින් ගොඩනැගුණු ඇය, තමන්ට ජීවත් වීම සඳහා නිවස පවා සාදාගෙන ඇත්තේ මෙම ව්‍යාපාරයෙන් ලද ලාභයෙන් බව අනාවරණය විය.

**02. ව්‍යවසායකයා : කේ.ජී. තිලකාවති මහත්මිය**

| | | |
|---|---|---|
| ව්‍යාපාරය | :- | බෑග් වර්ග, පාපිසි නිෂ්පාදනය |
| ලිපිනය | :- | 215, පොරෝට්ටිරුව, බෙරවල, බඹරදෙණිය. |
| දුරකථන අංක | :- | 075 - 5531023 |
| සමෘද්ධි කලාපය | :- | බඹරදෙණිය |

ආරම්භය :- 2005 වර්ෂය

කේ.ජී. තිලකාවතී මහත්මිය සමෘද්ධි වැඩසටහනෙන්ගොඩනැගුණු කාන්තා ව්‍යවසායකයෙකි. ආර්ථික දුෂ්කරතාවයන් මැද ජීවත් වූ විවාහක දරුවන් දෙදෙනෙකු සිටින දිරිය කාන්තාවකි. ඇගේ ස්වාමි පුරුෂයා කුලී වැඩ කරන අතර එක් දරුවකු ආබාධිතය. විවිධ දුෂ්කරතා මධ්‍යයේ ජීවිතය සාර්ථක කරගෙන යන සුභවාදීව මුහුණ දෙන කාන්තාවක් වශයෙන් කිව හැකිය. මුලින් කුලී වැඩ කරමින් ජීවත් වූ ඇය සමෘද්ධි වැඩසටහන යටතේ ණය ලබාගෙන ව්‍යාපාරයක් ලෙස විවිධ වර්ගයේ බෑග් නිර්මාණය කිරීම සහ පාපිසි මැසීම සිදුකරනු ලබයි. 2005 වසරේදී අමුද්‍රව්‍ය ලබාගැනීම සඳහා රු. 5000 ණය ලබා ගනිමින් වර්තමානය වන විට රුපියල් ලක්ෂයේ ණය 03 ක් සහ රුපියල් 150 000 ණයක්ද ලබාගෙන ව්‍යාපාරය සාර්ථකව පවත්වාගෙන යන ග්‍රාමීය ව්‍යවසායකයෙකි.

### 03. ව්‍යවසායකයා : එම්.සී.එම්. ඉර්ෂාඩ් මහතා





ව්‍යාපාරය :- සපත්තු නිෂ්පාදනය

ලිපිනය :- 54 - A, පෙතියාගොඩ, මුරුතගහමුල.

දුරකථන අංක :- 081 - 5611332

077 - 8608008

සමෘද්ධි කලාපය :- දවුලගල

ආරම්භය :- 2015 වර්ෂය

එම්.සී.එම්. ඉර්ශාඩ් මහතා සමෘද්ධි වැඩසටහනෙන් ගොඩනැගුණු තරුණ ව්‍යවසායකයෙකි. මුලින් ඔහු සපත්තු නිෂ්පාදනය කරන ප්‍රමුඛ පෙලේ ආයතනයක කාර්මික ශිල්පියකු ලෙස සේවය කිරීමෙන් ලද අත්දැකීම ඔහුගේම ව්‍යාපාරයක් බවට පත් වීමට සමෘද්ධි බැංකුව මඟින් උදව් ලැබූ බවයි ඔහු පැවසුවේ. සමෘද්ධි බැංකුවේ ණය පහසුකම් ලැබීම මෙන්ම ඔහුගේ ව්‍යාපාරය දියුණුකර ගැනීම සඳහා රු. 50 000ක් වටිනා යන්ත්‍රයක් ප්‍රදානයක් ලෙස ලැබී ඇත. සමෘද්ධි බැංකුව වගේම අනෙකුත් බැංකු පහසුකම් ලබා ගනිමින් සිටින ග්‍රාමීය ව්‍යවසායකයෙකි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ සමෘද්ධි කාර්යාලය හරහා පුහුණු වැඩසටහන් හා අලෙවි ප්‍රදර්ශන වැඩසටහන් සඳහා යොමු කිරීම තුලින් ද ඔහුගේ ව්‍යාපාරය දියුණු මට්ටමට ගෙන ඒමට හැකි වූ බව පෙන්වා දෙන ලදි.

**04. ව්‍යවසායකයා : කේ.පී.රන්මැණිකේ මහත්මිය**





ව්‍යාපාරය :- හාල්පිටි, මිරිස් සහ තුනපහ කුඩු නිෂ්පාදනය

ලිපිනය :- 336/D, දෙහිපාගොඩ, ගෙලිඔය.

දුරකථන අංක :- 081 - 7921513 / 075 - 5504651


සමෘද්ධි කලාපය :- ගෙලිඔය


ආරම්භය :- 2005 වර්ෂය

කේ.ජී. රන්මැණිකේ මහත්මිය ඇගේ විවාහක සැමියා සහ දරුවන් තිදෙනෙකු සිටින දිරිය කාන්තාවකි. ඇයගේ ජීවිත කතාව සංවේදී කතාවක් බව අසන හැමෝටම දැනෙන දෙයකි. 1998 සිට 2003 දක්වා කාලය ඇයගේ ස්වර්ණමය යුගයක් ලෙස ඇය පවසන්නීය. සැමියා වන විජේරත්න මහතා ගෙලිඔය ප්‍රදේශයේ මේ කාලයේ සිටිය හොඳ ව්‍යාපාරිකයෙක් බව ඇය විස්තර කලාය. 2003 අප්‍රේල් 4 වන දින රාත්‍රියේ සිදුවූ මහා ගින්නකින් ඔවුන්ගේ සියලු සේසත අහිමි වූයේ කිසිදෙයක් සිතා ගැනීමට මොහොතක් ඉතිරි නොකරමින් බව අප සමග කඳුළු දෙනෙතින් පැවසුවාය.

2005 වසරේදී සමෘද්ධි වැඩසටහන සමග එකතු වී එහි වැඩසටහන් තුලින් ගොඩනැගුණු දිරිය කාන්තාවක් ලෙස ඇය හඳුනා ගන්නා ලදි.

## 05. නන්දා පද්මසිරි මහත්මිය





ව්‍යාපාරය :- විසිතුරු මල් පැල අලෙවිය

ලිපිනය :- නො. 78, ගංහත.

දුරකථන අංක :- 077 - 4747001

සමෘද්ධි කලාපය :- ගංහත

ආරම්භය :- 2000 වර්ෂය

නන්දා පද්මසිරි මහත්මිය ඇගේ විවාහක සැමියා සහ දරුවන් දෙදෙනෙකු සිටින දිරිය කාන්තාවකි. වර්ෂ 2000 දී ඇය තම සැමියා වන එච්. පී. දියනේරිස් මහතා සමග එකතු වී තේ පැල තවානක් නඩත්තු කරමින් සිට ඇත. ඉතා සාර්ථකව කලද පැල තවාන මගින් වෙළඳපල ජයගැනීමට නොහැකි විය. එය අසාර්ථක වීමත් සමග ස්වයං රැකියාවක් ලෙස කුඩ සෑදීම කරගෙන ගොස් ඇත. ප්‍රධාන කුඩ නිෂ්පාදන ආයතනයකින් නිවසටම එහි කොටස් එකලස් කිරීම සඳහා ලබා දේ. ඒවා නිමි තත්වයට පත් කර නැවත ලබා දීම තුලින් කෑලි පදනම මත ඇයට වැටුපක් ගෙවනු ලැබේ. නමුත් එම ස්වයං රැකියාවෙන් ඔවුන්ට ජීවත් වීමට බැරි බව දැනගත් ඇය සමෘද්ධි වැඩසටහන යටතේ ණයක් ලබාගෙන මල් පැල අලෙවිය 2010 දී ආරම්භ කර ඇත. පළමුව රු. 5000 ණයක් සමෘද්ධි බැංකුවෙන් ලබාගෙන වර්තමානය වන විට රු. 50 000 ණය මුදලද කිහිප වතාවක් ලබා ඇති බව අනාවරණය විය.

ඉහත සඳහන් ව්‍යවසායකයින් පිළිබඳ අධ්‍යයනය කිරීමේදී විවිධ නිර්ණායක ඔස්සේ දත්ත හා තොරතුරු ලබා ගන්නා ලදි. මෙම ව්‍යවසායකයින්,

- සමෘද්ධි වැඩසටහනේ ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් තුලින් ගොඩනැගුණු ව්‍යවසායකයෙක්ද?
- ණය ගනුදෙනු බැංකුව සමඟ සිදුකරන ආකාරය පිළිබඳව
- පවුලේ ආර්ථිකයට කර ඇති බලපෑම
- සමෘද්ධි බැංකුවේ සහ ග්‍රාමීය මට්ටමින් සම්බන්ධවන සමෘද්ධි සංවර්ධන නිලධාරින්ගේ මගපෙන්වීම හා අධීක්ෂණය සිදුවන ආකාරය
- ව්‍යාපාරය පරිසර හිතකාමී ලෙස සහ සමාජීය හිතකාමී ව්‍යාපාරයක්ද?
- ගනුදෙනු සටහන් තබා ගන්නා ආකාරය පිලිබඳ
- නව තාක්ෂණය හා නවීකරණයෙන් යුතුව ක්‍රියාත්මක ව්‍යාපාරයක්ද?

ආදී කාරණා ඔස්සේ ද දත්ත හා තොරතුරු සොයා බැලීම සිදු කරන ලදි. ඉන් අනතුරුව සියළු නිර්ණායක ඔස්සේ විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍ය අවශ්‍යතා ඉටු කරන බැංකුවක් ලෙස සමෘද්ධි බැංකුව ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර දියුණුව සඳහා ඉටුකල දායකත්වය

කෙසේද යන්න සොයා බැලීමට මේ අතරින් ඉතාම සුදුසු ව්‍යවසායකයා තෝරා ගන්නා ලදි. එසේ තෝරාගත් ව්‍යවසායකයා ලෙස ගෙලිඔය සමෘද්ධි කලාපයේ දෙහිපාගොඩ වසමේ පදිංචි කේ. පී. රම්මැණිකේ මහත්මිය සඳහන් කළ හැකිය.

## 2.3. සාර්ථක ව්‍යවසායකයා

මැණික් නිශ්පාදන

Manik Products







අයිතිකරු :- කේ. පී. රන්මැණිකේ මහත්මිය

ලිපිනය :- 366, දෙහිපාගොඩ, ගෙලිඔය.

ලි. ප. අ. :- ම. ප. ස. උ. නු. 1665

ගෙලිඔය සමෘද්ධි කලාපයේ ඉතා සාර්ථකව ගොඩනැගුණු ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයෙක් ලෙස මහනුවර දිස්ත්‍රික්කයම දන්නා ඇය නමින් කේ.පී.රන්මැණිකේ මහත්මියයි. වයස අවුරුදු 62 ක් වන ඇය පරාද වූ ජීවිතය ජයගත් දිරිය කාන්තාවක් වශයෙන් සදහන් කල හැකිය. විජේරත්න මහතා ඇගේ ස්වාමිපුරුෂයා වන අතර දරුවන් තිදෙනෙකුගේ ආදරණීය මවකි. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය හදාරා ඇත.

රන්මැණිකේ මහත්මියගේ ඉතිහාස කතාව මෙසේ විය. ඇගේ සැමියා වන විජේරත්න මහතා 1998 - 2003 කාලයේදී ගෙලිඔය ප්‍රදේශයේ පමණක් නොව අනෙක් ප්‍රදේශ වලද නමක් දරා සිටි ව්‍යාපාරිකයෙකි. ඔහු විජය නිෂ්පාදන නමින් මිරිස්, තුනපහ කුඩු සහ හාල් පිටි නිෂ්පාදන කර්මාන්තයේ දියුණු වූ කෙනෙක් වශයෙන් ඇය අප සමග කරුණු ඉදිරිපත් කලාය. ගෙලිඔය නගරයට ආසන්න ස්ථානයක කුලී පදනම මත ලබාගත් ස්ථානයක කලින් ව්‍යාපාරය ඉතා සාර්ථකව කරගෙන ගොස් ඇත. ඉහල ධාරිතාවයකින් යුතු යන්ත්‍ර 4ක්, ලොරි රථයක්, වෑන් රථයක් සහ ස්ථිර සේවකයින් 06 දෙනෙකු සිටි දියුණු ව්‍යාපාරයක් පවත්වාගෙන ගොස් ඇත. ඔවුන්ගේ නමින් ආදායම් බදු ගෙවාගෙන යන වෙනම ලිපිගොනුවක්ද වාර්ෂිකව ගිණුම් වාර්තා ඉදිරිපත් කරමින් මෙම ව්‍යාපාරය ඉතා හොදින් පවත්වාගෙන ගොස් ඇත. ලංකාවේ දිස්ත්‍රික්ක කිහිපයකම අලෙවි ජාලයක් පවත්වාගෙන ගොස් ඇත. එසේම වාණිජ බැංකු වලින් විශාල ලෙස ණය සහ අනෙකුත් පහසුකම් සපයා ඇත. අවාසනාවන්ත ලෙස 2003 අප්‍රේල් 04 වන දින රාත්‍රියේ මෙම ව්‍යාපාර ස්ථානයේ ගින්නක් හටගෙන ව්‍යාපාරයේ සියලු දේවල් විනාශ විය. ව්‍යාපාරයේ තිබූ යන්ත්‍ර සූත්‍ර සහ අමුද්‍රව්‍ය හා නිමිද්‍රව්‍ය තොග මුලුමනින්ම ගින්නෙන් විනාශ වී ගියේය. ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම බිඳ වැටුණි. ඒ වන විට බැංකු වලින් ලබාගෙන තිබූ ණය ගෙවා ගැනීමට අපහසු වී ගිනි පොලී කාරයින්ගෙන් ණය ලබා ගැනීමට සිදු වී ඇත. තමන් ජීවත්ව සිටි නිවසද බැංකු වලට උකස් කර තිබීම නිසා ණය ගෙවා ගැනීමට අපහසු වී වෙන්දේසි වන තැනට පත් විය. විජේරත්න මහත්තයා කුලී වැඩ සොයාගෙන කොළඹ ප්‍රදේශයට ගිය අතර එයට හේතුව තම ප්‍රදේශයේ කුලී වැඩ කිරීමට ආත්මශක්තියක් නොතිබීම හේතුව උසස් ලෙස ඔවුන් ජීවත් වූ නිසාය. රම්මැණිකේ මහත්මිය දරු තිදෙනා සමග එදා වේල කන්න නැති තැනට වැටුණා. වාහන ලීසිං ගෙවාගන්න අපහසු වී

ඒවාද විකිණීමට සිද්ධ විය. ගෙදර වෙන්දේසි වීමට දින තීරණවූ අතර, ඔවුන්ට ඉඩමක් වෙනුවෙන් අයවිය යුතුව තිබූ මුදලක් ලැබීම නිසා නිවස බැංකුවෙන් බේරා ගැනීමට හැකි විය. ඔවුන් ගනුදෙනු කල වාණිජ බැංකු වලට ගොස් කතා කලද නැවත ව්‍යාපාරය පටන් ගැනීමට උදවු ලැබී නැත. අභිමානයෙන් ජීවත් වූ රන්මැණිකේ මහත්මියගේ පවුලට එදා වේල සොයාගැනීමට නොහැකිතත්ත්වයට ජීවිතය පත්විය.

2005 දී එවකට රාජකාරී කල සමෘද්ධි සංවර්ධන නිලධාරී සහ කළමනාකාරතුමාගේ මඟ පෙන්වීම මත සමෘද්ධි වැඩසටහන සමඟ සම්බන්ධ විය. සමෘද්ධි සංවර්ධන නිලධාරීතුමියගේ මැදිහත් වීම මත සහනාධාර කාඩ්පතක් ලබාදී වැඩසටහනට ඇතුලත් කර ගන්නා ලදි. රන්මැණිකේ මහත්මිය තුල ඇති ව්‍යවසායකත්ව ලක්ෂණ හදුනාගත් එවකට වසමේ රාජකාරී කල සමෘද්ධි සංවර්ධන නිලධාරීතුමිය විසින් එතුමියගේ සැඟවුණු හැකියාවන් මතුකර ගැනීමට සමත් විය. නිතර රන්මැණිකේ මහත්මිය සමග සාකච්ඡා කරන ලදි. විනාශ වී ගිය ව්‍යාපාරය නැවත පටන් ගැනීමට හැකියාව ඇති බව තේරුම්ගත් සමෘද්ධි නිලධාරීන් ඇය වෙත රු. 10 000 ක ව්‍යාපෘති ණය මුදලක් ලබා දීමට තීරණය කරන ලදි. නමුත් කිසිම කෙනෙක් (කණ්ඩායමේ) ඇපයට අත්සන් කිරීමට කැමති නොවීය. හේතුව ඔවුන්ගේ බංකොලොත් වූ ව්‍යාපාරය පිළිබද ගමේ අය දැනුවත් වී තිබීම නිසාය.සමෘද්ධි නිලධාරීන්ගේ මැදිහත් වීම මත පසුව කණ්ඩායමේ සමාජිකයින් කැමැත්ත දෙන ලදි. සමෘද්ධි බැංකුවෙන් ලබාගත් ණය මුදලින් සහ කලින් ව්‍යාපාරයේ ගින්නට හසු නොවී ගෙදර තිබූ එක් ඇඹරුම් යන්ත්‍රයත් ඇයතුළ තිබූ ව්‍යාපාරික දැනුමත් යොදාගෙන නැවත හාල්පිටි නිෂ්පාදන ව්‍යාපාරය ආරම්භ කරන ලදි.

ව්‍යාපාරයේ ආරම්භක වත්කම් (2005) (රු.)

| | |
|---|---|
| 1. සමෘද්ධි බැංකු ණය | = 10 000 |
| 2. ඇඹරුම් යන්ත්‍ර | = 20 000 |
| එකතුව | = 25 000 |

සමෘද්ධි බැංකුවෙන් ලබාගත් ණය මුදල අවශ්‍ය අමුද්‍රව්‍ය ලබාගැනීම සදහා යොදා ගන්නා ලදි. මුලින්ම ඉදිආප්ප පිටි නිෂ්පාදනය කරන ලද අතර, පසුව අග්ගලා පිටි, අලුවා පිටි, මිරිස් කුඩු, තුනපහ කුඩු, කහ කුඩු සහ චිලි පේස්ට් නිෂ්පාදන එකතු කර ගන්නා ලදි.

**අග්ගලා පිටි 1 kg ක පිරිවැය සහ ලාභය (රුපියල් වලින්.)**

| | |
|---|---|
| සහල් | = 90.00 |
| ගම්මිරිස්, ලුනු, එනසාල් | = 2.00 |
| බැදුම් කුලිය | = 8.00 |
| අනෙකුත් | = 2.00 |
| මුළු පිරිවැය | = 102.00 |
| ලාභය | = 38.00 |
| විකුණුම් මිල | = 140.00 |

**අලුවා පිටි 1 kg ක පිරිවැය සහ ලාභය**

| | |
|---|---|
| සහල් | = 90.00 |
| සුදුරු, එනසාල් | = 2.00 |
| බැදුම් කුලිය | = 8.00 |
| අනෙකුත් | = 2.00 |
| මුළු පිරිවැය | = 102.00 |
| ලාභය | = 38.00 |
| විකුණුම් මිල | = 140.00 |

**මිරිස් කුඩු 1 kg ක පිරිවැය සහ ලාභය**

| | |
|---|---|
| වියළි මිරිස් 1 kg | = 230.00 |
| ඇඹරුම් හා ඇසුරුම් වියදම | = 15.00 |
| මුළු පිරිවැය | = 245.00 |
| ලාභය | = 35.00 |
| විකුණුම් මිල | = 280.00 |

අග්ගලා සහ අලුවා පිටි පැකට් කර අලෙවියෙන් හොඳ ලාභයක් ලැබෙන බව රන්මැණිකේ මහත්මිය ප්‍රකාශ කලාය. සහල් මිටියක් (කිලෝ ග්රෑම් 50) බැදීම සදහා කුලී ලෙස රුපියල් 400 ක් වැය වන බව සදහන් කලාය. සහල් මිලදී ගැනීමේදී සුදුසු සුදු කැකුළු සහල් වර්ගයක් තෝරාගත යුතු වන අතර සහල් එක මත අග්ගලා සහ අලුවා පිටි වල ගුණාත්වය තීරණය වන නිසාය. ගෙලිඔය නගරයේ තොග බඩු දෙන වෙළදසැලක් ඇති බවත් හොඳ සහල් වෙළදසැලට ලැබුණු වහාම රම්මැණිකේ මහත්මියට ඒ බව දැනුම් දෙන මට්ටමට ව්‍යාපාරික ප්‍රජාව ඇයට සහය වන බව පවසන ලදි.

සහල් පිටි කිරීමේ සිට පැකට් කිරීම, ඒවා ඇසුරුම් කිරීම සහ වෙළඳපල කරා යොමු කිරීම රන්මැණිකේ මහත්මියත් ඇයගේ ස්වාමි පුරුෂයා වන විජේරත්න මහතාත් යන දෙදෙනා අතින් සිදුවන නිසා කුලී ලෙස බාහිරට මුදල් ගලා යාමක් සිදු නොවන අතර ඒ හේතුවෙන් මොවුන්ගේ ව්‍යාපාරය දියුණු මට්ටමකට ගෙන ඒමට හේතු විය

රන්මැණිකේ මහත්මියත් ඇයගේ ස්වාමි පුරුෂයා වන විජේරත්න මහතා



මිරිස් කුඩු නිෂ්පාදනයට අවශ්‍ය වියළි මිරිස් නුවර නගරයේ තොග වෙළදසැලකින් මිලදී ගන්නා අතර එය ගුණාත්වයෙන් ඉහළ මිරිස් වර්ග මිලදී ගැනීම සිදුකරයි. වෙළදපලේ බාල වර්ගයේ වියළි මිරිස් පවතින නිසා විශ්වාස තැනකින් ලබා ගැනීම අවශ්‍ය බව ඔහුගේ මතය විය. සහල්, මිරිස් සහ තුනපහ වර්ග ඇඹරීම සදහා එයට සුදුසු යන්ත්‍ර භාවිතා කරන අතර එම යන්ත්‍ර පිළිබද

කාර්මික දැනුම විජේරත්න මහතා තුල තිබීම ඔවුන්ගේ සාර්ථකත්වය පෙන්වන සම්පතකි. යන්ත්‍ර සඳහා වැය වන විදුලි ඒකක ප්‍රමාණය අවම මට්ටමක පවත්වා ගනිමින් කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය උපරිම අයුරින් ලබා ගැනීමට විජේරත්න මහතාගේ කාර්මික ඥානය මහත් සේ පිටුවහලක් කරගෙන ඇත. වසර ගණනක පලපුරුද්ද මත ලැබුණු එම විශේෂඥතාවය ඔවුන්ගේ ව්‍යාපාරය ශක්තිමත් වීමට බලපා ඇති සාධක අතර වේ. විජේරත්න මහතාගේ එම විශේෂ හැකියාව නොතිබුණානම් යන්ත්‍ර ක්‍රියාවිරහිත වන අවස්ථා වලදී බාහිර කාර්මිකයකු වෙනුවෙන් විශාල කාලයක් සහ පිරිවැයක් දරන්නට සිදුවනු ඇත.


මෙම ව්‍යාපාරයේ වැඩ කටයුතු කරගෙන යාම සඳහා ස්ථිර ලෙස සේවකයන් දෙදෙනෙකු සිටින අතර ඒ අය සඳහා ඔවුන්ට හිමිවන්නේ දෛනික වැටුප් නොව කොන්ත්‍රාත් ක්‍රමයට දීමනාය. එයට හේතුව නිතරම ක්‍රියාත්මක වන නිෂ්පාදන ක්‍රියාවලියක් නොවීමයි. පවතින වැඩෙහි ස්වරූපය අනුව ගෙවීම සිදුවන අතර එය මිරිස් සහ හාල් කිලෝ පදනම මත ගෙවීම් සිදුකිරීමය. රන්මැණිකේ මහත්මියගේ සහ විජේරත්න මහතාගේ කලින් තිබූ ව්‍යාපාරය නොසිතූ ලෙසින් කඩා වැටීම නිසා ඇති වූ තත්ත්වය සංවර්ධන පාඩමක් කරගත් මොවුන් එහි අත්දැකීම් වලින් නව ව්‍යාපාරය දියුණු කරගෙන ඇත. විශාල ඇණවුමක් ලද විට බාහිර ශ්‍රමය මුදලට ලබා ගන්නා අතර හැකි සෑම ඇණවුම් සඳහාම මොවුන්ගේ ශ්‍රම දායකත්වය පමණක් යොදාගෙන මනා කළමනාකරණයෙන් ව්‍යාපාරය කරගෙන යන බව පෙනෙන කරුණකි.

සමෘද්ධි බැංකුව මගින් ලබාදුන් ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම්

**වගුව අංක 03**

ණය පහසුකම්

| වර්ෂය | ණය මුදල (රු.) |
|---|---|
| 2005 | 10 000 |
| 2006 | 15 000 |
| 2007 | 25 000 |
| 2009 | 50 000 |
| 2012 | 100 000 |
| 2014 | 100 000 |
| 2016 | 400 000 |



මූලාශ්‍රය : ගෙලිඔය සමෘද්ධි බැංකු දත්ත අනුව

2005 සිට 2016 දක්වා කාලය තුළරම්මැණිකේ මහත්මිය සදහා සමෘද්ධි බැංකුව මගින් ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ඉතා ඉහල ආකාරයට ලබා දී ඇත. එතුමියට 2005 වසරේ රු. 10 000 ණය මුදලක් බැංකුවෙන් ලබා දී ඇති අතර එය 2012 වන විට රුපියල් 100 000 ප්‍රමාණයට ණය වැඩිකර ගෙන ඇත. එය ව්‍යාපාරයක දියුණුවේ ලක්ෂණයකි. 2016 වන විට රුපියල් ලක්ෂ දෙකේ ණය දෙකක් එනම් රුපියල් ලක්ෂ හතර දක්වා ණය මුදල් වැඩි කරගෙන ඇත. ණය මුදලේ ප්‍රමාණය 200% ක ප්‍රතිශතයක් වැඩි වීම පෙන්නුම් කරයි.

මෙම ව්‍යවසායකයාගේ තවත් දක්නට ලැබෙන විශේෂ කරුණක් වන්නේ බැංකුවෙන් ලබා ගන්නා ණය මුදල් ගිවිසගත් කාලයට කලින් කිසිදු දඩ මුදලකට යටත් නොවී ගෙවා අවසන් කිරීමයි. රම්මැණිකේ මහත්මිය ලබාගන්නා ණය මුදල ඉතා ඉහල අන්දමින් කළමනාකරණය කරගෙන බැංකුවේ මූල්‍ය විශ්වාසභාවය රැකගනිමින් ගෙවා අවසන් කිරීම හොද ව්‍යවසායකත්ව ලක්ෂණයකි.ග්‍රාමීය අනෙකුත් ව්‍යවසායකයින්ට මෙන්ම ණය ලබා ගන්නා සාමාජිකයන්ට මෙයින් ආදර්ශයක් සපයා ඇත.

උපකරණ ලබා දීම

- රු. 25 000 වටිනා ඇඹරුම් යන්ත්‍රයක් 2014 දී ලබා දී ඇත.



රක්ෂණ පහසුකම

ලබාගත් ණය මුදල් වෙනුවෙන් සමෘද්ධි බැංකුව හරහා රක්ෂණාවරණයක් ලබා දී ඇත. හදිසි අනතුරක් හේතුවෙන් අකර්මන්‍යතාවයට පත් වූ විට ප්‍රතිලාභියාගෙන් ණය මුදල අය නොකරන අතර ඒ වෙනුවෙන් රැකවරණයක් ලබා දී ඇත. මෙම පහසුකම් ග්‍රාමීය කුඩා පරිමාණ ව්‍යවසායකයින්ට ඉතා වටිනා බව ප්‍රකාශ කරන ලදි.

සමෘද්ධි බැංකුව මගින් රම්මැණිකේ මහත්මියගේ ව්‍යාපාරය සඳහා ලබාදුන් වෙනත් පහසුකම්

- පුහුණු වැඩසටහන් වලට සම්බන්ධ කර විවිධ ව්‍යාපාරික පුහුණු ලබා දීම.
- වෙළඳ ප්‍රදර්ශන හා අලෙවි පොලවල් සඳහා සම්බන්ධ කිරීම.
- ව්‍යවසාය සංගම් ඇති කිරීම.
- අලෙවිය වැඩි කර ගැනීම සඳහා නව වෙළඳපලවල් සොයා දීම.
- කුසලාන සහ සහතික පත් ලබාදී ඇය දිරිමත් කිරීම

පසුගියමාස කිහිපයක රම්මැණිකේ මහත්මියගේ ව්‍යාපාරය ලැබූ ආදායම

වගුව 04

| මාසය 2017 | ආදායම(රුපියල්) |
|---|---|
| ජනවාරි | 50,000 |
| පෙබරවාරි | 30,000 |
| මාර්තු | 50,000 |
| අප්‍රේල් | 70,000 |
| මැයි | 50,000 |
| ජූනි | 60,000 |

මූලාශ්‍රය : කේ.ජී. රන්මැණිකේ මහත්මියගේ තොරතුරු

ඉහත සඳහන් වගුව අනුව රන්මැණිකේ මහත්මියගේ ව්‍යාපාරයේ මාසික ආදායම් වර්ධනයක් පෙන්නුම් කරයි.

ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයෙකු ලෙස 2005 වර්ෂයේ සිට 2016 වන විට ඉතා හොඳ මට්ටමකට ව්‍යාපාරය ගොඩනැගී ඇති බව ඉතා පැහැදිලි

කරුණකි. 2005 වසරේ රන්මැණිකේ මහත්මිය සිටියේ ඉතා අන්ත අසරණ තත්ත්වයක එදා වේල සොයාගත නොහැකිව. අධික ණය බරකින් සහ මානසික පීඩාවකින් ජීවත් වූ පවුලක් ලෙසය. 2005 වසරේ සමෘද්ධි වැඩසටහන යටතේ සමෘද්ධි බැංකුව ලබා දුන් මූලික ණය මුදලෙන් ආරම්භ කල හාල් පිටි නිෂ්පාදනය කරන රන්මැණිකේ මහත්මිය, සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් යටතේ ගොඩනැගුණු ඉතා සාර්ථක ව්‍යවසායකයෙකි. වර්තමානය වන විට ඇය ව්‍යාපාරය දියුණු කරගනිමින් මෝටර් රථ දෙකක් සහ නිවස අංගසම්පූර්ණ කරගත් ව්‍යවසායකයෙකු ලෙස සඳහන් කල හැකිය. වර්තමානය වන විට දරුවන් තිදෙනා සඳහා අධ්‍යාපනය ලබා දී ඔවුන්ගේ ජීවිතද සාර්ථක කර ඇත. ඇයගේ ස්වාමි පුරුෂයා වන විජේරත්න මහතාගේද සහය ඇතිව ඉතා සාර්ථකව ව්‍යාපාරය පවත්වාගෙන යනු ලැබේ. 2005 වසර වන විට පවුලේ නඩත්තු කටයුතු කරගැනීමටවත් නොහැකිව සිටි ඇය, මේ ව්‍යාපාරය දියුණු වීමෙන් පවුලේ නඩත්තු කටයුතු ඉතා ඉහල මට්ටමින් ඉටුකරගනී. මේ වන විට ඇයගේ වැඩිමහල් පුතා වන නවෝද් මහතා විවාහ වී ඔහුගේම බර වාහන කාර්මික වැඩපලක් කරගෙන යන අතර ඔහුටද මෝටර් රථයක් ලබා ගැනීම සඳහා තම ව්‍යාපාරයෙන් උපයන ලද ලාභයෙන් රුපියල් ලක්ෂ 10 ක් පමණ යෙදවූ බව සඳහන් කරන ලදි. එසේම ඇගේ දියණිය විවාහ කර දී ඇයට මෙම ව්‍යාපාරය ඇය පදිංචිව සිටින මහනුවර ජම්බුගස් පිටිය ප්‍රදේශයේ ශාඛාවක් ලෙස පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු සැලසුම් කර දී ඇත. එය ව්‍යාපාරය පුළුල් කිරීමේ හොඳ ලක්ෂ්‍යයක් ලෙස සඳහන් කල හැකිය. බාල පුතා වන ගයාන් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ තොරතුරු සන්නිවේදන අංශයේ රැකියාවක නිරත වන්නේය.

## 2.4. ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයින් මුහුණ දෙන ගැටලු හා බාධක

වත්මන් සමාජය තුළ තරඟකාරී ව්‍යාපාරික ලෝකයක් බිහි වී ඇත. සීමිත සම්පත් තුලින් අසීමිත අවශ්‍යතාවයන් සපුරාලමින් ග්‍රාමීය සමාජයේ ආර්ථික මෙහෙවර ඉටු කරනුයේ සුළු පරිමාණ ව්‍යවසායකයින් මගිනි. වෙළඳ ආර්ථික පරිසරයක් තුල දක්නට ලැබෙන අසීමිත තරඟකාරීත්වය හමුවේ ඔවුන්ගේ ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන්නේ තර්ජන හා අභියෝග මැදය. එසේම රටේ පවතින විවිධ නීති රීති හා අණපනත් මැද ග්‍රාමීය ව්‍යවසායකයා මහත් දුෂ්කර හා කාර්යබහුල වටපිටාවක තම ව්‍යාපාර පවත්වාගෙන යන අතර, එම නිසා ඔවුන් මුහුණ දෙන ගැටලු හා බාධක රාශියකි.

- ප්‍රාග්ධන හිඟකම

  ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයන් බලාපොරොත්තු වන අයුරින් තම ව්‍යාපාරය ආරම්භ කිරීමට හා පුළුල් කිරීමට නොහැකි තත්වයක් මෙම අධ්‍යයනය තුලින් අනාවරණය විය. එයට හේතු වශයෙන් ඔවුන් පෙන්වා දෙන ලද්දේ අවශ්‍ය මූල්‍යධනය නොමැති කමයි.

- බහු ජාතික සමාගම් වල බලපෑම

  ග්‍රාමීය සුළු පරිමාණ නිෂ්පාදකයන්ගේ නිෂ්පාදන වලට ආදේශන සහ එම භාණ්ඩ හා සේවා ඉතා අඩු මිලට දේශීය වෙළඳපලට පැමිණීම නිසා ඔවුන් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් ලෙස මෙම අධ්‍යයනයේ දී අනාවරණය විය. (ඉන්දියාව, චීනය වැනි රටවලින්)

- ආනයන ආදේශන සමග තරඟ කළ නොහැකි වීම

  සංවර්ධිත රටවල් තාක්ෂණය උපයෝගී කරගෙන ඉහළ ගුණාත්වයෙන් යුතුව ඉතා අඩු මිලට වෙළඳපලට භාණ්ඩ සැපයීම නිසා වෙළඳපල ආක්‍රමණය කර ඇත. ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයා ඔවුන්ගේ දේශීය තාක්ෂණය යොදාගෙන නිපදවන විට ඉහල පිරිවැයක් දැරීමට සිදුවේ. එම නිසා ග්‍රාමීය ව්‍යවසායකයාට තරඟ කිරීමට නොහැකි වේ. එසේම පාරිභෝගික ආකර්ෂණය දිනා

ගැනීමටද අපහසු වේ. මේ හේතුව නිසා ග්‍රාමීය ව්‍යවසායකයා මහත් අසීරුතාවයට මුහුණ දීමට සිදු වන බව අනාවරණය විය.

- ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයින්ගේ දැනුම අඩුකම

  සුළු පරිමාණ කර්මාන්ත ආරම්භ කලද එය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කළමනාකරණ දැනුම ප්‍රමාණවත් නොවීම ඔවුන් මුහුණ දෙන ගැටලුවක් ලෙස මෙම අධ්‍යයනයෙන් හඳුනා ගන්නා ලදි.

- යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම

  ශ්‍රී ලංකාවේ තාමත් යටිතල පහසුකම් බොහෝ ව්‍යාප්ත වී ඇත්තේ නගරය කේන්ද්‍රකොට ගෙනය. නගරයෙන් ඈත් වන්නට යටිතල පහසුකම් අවම මට්ටමක පවතී. ප්‍රවාහනය, සන්නිවේදන පහසුකම් සඳහා ඉහල පිරිවැයක් දැරීමට සිදුවේ. නව තාක්ෂණය තාමත් ඇතැම් ගම් වලට පැමිණ නැත. එය මොවුන් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවකි.

- ව්‍යාපාර සැලසුම් නොමැති වීම

  ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයින් තම ව්‍යාපාරය මෙහෙයවන්නේ තමන්ට හිතෙන ආකාරයටය. එම නිසා ව්‍යාපාරය අඩාල වේ. ව්‍යාපාරයට අවශ්‍ය නිශ්පාදන සැලැස්මක්, අලෙවිකරණ සැලැස්මක්, මෙහෙයුම් කළමනාකරණ හා මූල්‍ය සැලැස්මක් නිසි ලෙස පවත්වාගෙන යන්නේ නැත. මේ නිසා ව්‍යාපාරය දියුණු කිරීමට අපහසුය. මේ බව මෙම අධ්‍යයනයෙන් අනාවරණය විය.

- ලෝකයේ වෙනස් වීම් වලට මුහුණ දීමට නොහැකි වීම

  වත්මන් ව්‍යාපාරික ලෝකය සන්නිවේදනයේ දියුණුවත් සමග විශ්ව ගම්මානයක් බවට පත්වී තිබේ. ආර්ථිකය, සමාජය හා සංස්කෘතිය ඉතා වේගයෙන් වෙනස් වේ. මෙම වෙනස් වීමට වේගයෙන් ප්‍රතිචාර දැක්වීමට ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයින්ට නොහැකි වීම ඔවුන් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් බවට පත් වී ඇති බව අනාවරණය විය.

- පවතින ව්‍යාපාරික නීති රීති හා බදු ප්‍රතිපත්ති පිළිබඳ දැනුම අඩුකම

ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමේදී රටේ පවතින නීති රීති හා අනපනත් පිළිබද දැනුම මදි කම ඔවුන් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් බවට පත්ව ඇත. කලින් කලට වෙනස් වන බදු ප්‍රතිපත්ති පිලිබදව ද අඩු දැනුමක් ඇති බව අනාවරණය විය

## තුන්වෙනි පරිච්ඡේදය

## 3. නිගමන හා යෝජනා

### 3.1. නිගමන

- ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයින් සංචාරක ක්ෂේත්‍රයේ ව්‍යාපාර සදහා අඩු නැඹුරුතාවයක් පෙන්නුම් කෙරේ.

- කේ. පී. රම්මැණිකේ මහත්මියගේ සියලු දේපලම විනාශ වී බංකොලොත් තත්වයට පත් වීම නිසා තම ජීවිතයේ ලද අභියෝග වලට සාර්ථකව මුහුණ දුන් දිරිමත් කාන්තාවකි.

- ග්‍රාමීය ව්‍යවසායකයින් තම සම්පත් හා ලද අත්දැකීම් ඔවුන්ගේ ව්‍යාපාර සදහා යොදා ගැනීම.

- සාර්ථක ව්‍යවසායකයින්ගේ ඇති කළමනාකරණ හැකියාව කේ. පී. රම්මැණිකේ මහත්මිය සතුව ඇත.

- සමෘද්ධි බැංකුවේ ක්ෂුද්‍ර මූල්‍ය අධීක්ෂණ වැඩපිළිවෙල ඉහළ මට්ටමක පැවතීම.

- සමෘද්ධි කුඩා කණ්ඩායම, ග්‍රාමීය සංවිධාන සහ බැංකුව එකම ජාලයක් ලෙස ක්‍රියාත්මක වීම නිසා ග්‍රාමීය ව්‍යවසායකයාට ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ගලා ඒම.

## 3.2.යෝජනා

- සමෘද්ධි බැංකුව වෙත ණය ලබා ගැනීම සදහා ව්‍යවසායකයින් බැංකුව වෙත එනවා වෙනුවට බැංකුවේ නිලධාරීන් ව්‍යවසායකයා ලගට යා යුතු බව.

- ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයින් සදහා ක්ෂුද්‍ර රක්ෂණ පහසුකම් සමෘද්ධි බැංකුව මගින් ක්‍රියාත්මක කිරීම.

- ග්‍රාමීය මට්ටමේ ව්‍යවසායකයින් සදහා දෛනික සහ සති ණය ක්‍රම හදුන්වා දීම.

- සමෘද්ධි බැංකුව මගින් උකස් ණය ක්‍රම සහ කල්බදු පහසුකම් ලබා දීම.

- ග්‍රාමීය ව්‍යවසායකයින් සදහා නවීන තාක්ෂණය ගලපා ගැනීම සදහා පහසුකම් ලබා දීම.

- ග්‍රාමීය නිශ්පාදන වලට අදාල ආදේශන භාණ්ඩ ආනයනය සීමා කිරීම හා බදු පැනවීම.

- ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයින් සංචාරක ක්ෂේත්‍රයේ ව්‍යාපාර සදහා නැඹුරු කිරීම.

- සමෘද්ධි වැඩසටහන හරහා අගය එකතු කල නිශ්පාදන සදහා පොලී සහන ලබා දීම.

- එක් එක් ගම්මාන සදහා විවිධාංගීකරණය කල ව්‍යාපෘති හදුන්වා දීම.

- ග්‍රාමීය ව්‍යවසායකයින් සදහා ව්‍යාපාර සැලසුම්කරණය පිළිබද දැනුම ලබා දීම.

- ව්‍යාපාරික නීති රීති හා කාලීනව වෙනස් වන බදු ප්‍රතිපත්ති පිළිබඳ ග්‍රාමීය ව්‍යවසායකයින් දැනුවත් කරන වැඩපිළිවෙලක් සකස් කිරීම.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


1. ව්‍යවසායකයා පිළිබඳ ප්‍රකාශනය - 1990 - පෙරේරා මහතා
2. Doing Business සඟරාව - 2016
3. The Business සඟරාව - 2017
4. ශ්‍රී ලංකා කාර්මික මණ්ඩලයේ ප්‍රකාශනය - 2017
5. App-Asian Politics & Policy - 2016, නදීකා දමයන්ති මහත්මිය
6. දිවිනැගුම දෙපාර්තමේන්තුව (සමෘද්ධි) කාර්ය සාධන වාර්තාව - 2015
7. සමාජ සවිබල ගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යංශයේ ප්‍රකාශන - 2017
8. උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සම්පත් පැතිකඩ - 2016
9. විදුකිරණ - දිලීපා සදරුවන්තිකා
10. ශ්‍රී ලංකා මහ බැංකුව වාර්ශික වාර්තාව - 2016
11. ආර්ථික විවරණය - මුදල් අමාත්‍යංශය - 2015
12. Impact of Samurdhi Microfinance Programme - M.M.M. Rizphy and U.K. Jayasinghe


## අන්තර්ජාල පිවිසුම් ලිපිනයන් (Website)


01. www.doingbusiness.com
02. www.samurdhi.gov.lk
03. www.hrmars.com
04. www.smetoolkit.org